**විශේෂ සටහන 20**

## ප්‍රධාන ආර්ථික ප්‍රතිපත්තිමය වෙනස්වීම් සහ ක්‍රියාමාර්ග : 2010[1]

### මූර්ත අංශය

2010 අප්‍රේල් 21 - පශ්චාත් සුනාමි වෙරළබඩ පුනරුත්ථාපන සහ සම්පත් කළමනාකරණ වැඩ සටහන - *"දියවර සවිය"* ආරම්භ කරන ලදී.

2010 අප්‍රේල් 30 - කෘෂි බෝග සහ දියර කිරි නිෂ්පාදනය ප්‍රවර්ධනය කිරීමේ ණය යෝජනා ක්‍රමය යටතේ ගැණුම්කරුවන් සහ විකුණුම්කරුවන් අතර කිරි ගවයන් හුවමාරු කර ගැනීම සඳහා පහසුකම් සැලසීම පිණිස ප්‍රථම කිරි ගව සම්පත් මධ්‍යස්ථානය හොරණ මීවනපලාන දී ආරම්භ කරන ලදී.

2010 දෙසැම්බර් 09 - වෙළෙඳපොලේ පවතින සහල් මිල ස්ථාවර කිරීම සඳහා උපරිම සිල්ලර මිලක් නියම කරන ලදී. මේ අනුව, සම්බා (කීරි සම්බා සහ සුදුරු සම්බා හැර) සඳහා උපරිම සිල්ලර මිල රුපියල් 70 ක් ලෙස නියම කළ අතර, නාඩු සහ රතු හා සුදු කැකුළු සහල් සඳහා උපරිම සිල්ලර මිල රුපියල් 60 ක් ලෙස නියම කරන ලදී.

2011 ජනවාරි 01 - සාමාන්‍ය විදුලිබල ගාස්තුව සියයට 8 කින් වැඩි කරන ලදී.

**අපේක්ෂිත**

- කෘෂිකාර්මික සංවර්ධනය සඳහා වූ ජාත්‍යන්තර අරමුදල මගින් ලද ආධාර යටතේ ජාතික කෘෂි ව්‍යාපාර සංවර්ධන වැඩ සටහන ආරම්භ කිරීම.

### විදේශ අංශය

**වෙළෙඳ සහ තීරු බදු**

2010 ජනවාරි 01 - ඇතැම් පී.වී.සී. හම් රෙදි වර්ග ආනයනය සඳහා අය කළ අධිභාරය ඉවත් කරන ලදී.

- 2008 නොවැම්බර් මස 06 වැනි දිනැති අංක 1574/15 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ සඳහන් වූ භාණ්ඩ හැර අනෙකුත් සියළුම ආනයනික භාණ්ඩ සඳහා ක්‍රියාත්මක වන සාමාන්‍ය හා වරණීය යන තීරු බදු දෙඅංශයම මත පනවන ලද සියයට 15 ක අධිභාරය තවත් මාස හයක කාලයක් දක්වා දීර්ඝ කරන ලදී.

2010 ජනවාරි 19 - පෙට්‍රල් සහ ඩීසල් ආනයනය සඳහා සම්පූර්ණ තීරු බදු අත්හැරීමක් ලබාදෙන ලදී.

2010 ජනවාරි 25 - බඩ ඉරිඟු ආනයනය සඳහා සියයට 12.5 ක තීරු බදු අත්හැරීමක් ලබා දෙන ලද අතර බලපවත්නා අදාළ තීරු බද්ද සියයට 2.5 ක් වේ.

2010 පෙබරවාරි 10 - වියළි හාල්මැස්සන්, අර්තාපල්, ලොකු ළූණු, මෑ වර්ගයේ ඇට, කොණ්ඩ කඩල, මුං ඇට, පරිප්පු, ටින් මාළු, සීනි, රතු ළූණු සහ සුදු ළූණු ආනයනය කිරීමේදී අය කළ විශේෂ වෙළෙඳ භාණ්ඩ බද්ද තවත් මාස තුනක කාලයක් සඳහා දීර්ඝ කරන ලදී.

2010 පෙබරවාරි 14 - ඇතැම් පී.වී.සී. හම් රෙදි වර්ග ආනයනය සඳහා ලබා දුන් කිලෝග්‍රෑමයට සියයට 13 ක තීරු බදු අත්හැරීම තවදුරටත් දීර්ඝ කරන ලදී.

2010 පෙබරවාරි 16 - කිරිපිටි ආනයනයේ දී අය කළ හැකි මුළු බදු ප්‍රමාණය කිලෝග්‍රෑමයට රුපියල් 100 සිට කිලෝග්‍රෑමයට රුපියල් 50 දක්වා අඩු කරන ලදී.

2010 පෙබරවාරි 18 - ආහාරයට ගන්නා ඇතැම් තෙල් වර්ග සහ ඒවායේ කොටස් ආනයනය සඳහා කිලෝග්‍රෑමයට රුපියල් 25 ක තීරු බදු අත්හැරීමක් ලබාදෙන ලදී.

- ස්ප්‍රීතු (එතිල් මධ්‍යසාර) ආනයනය මත මසකට ලීටර් 20,000 ක උපරිමයක් දක්වා ලීටරයකට රුපියල් 200 ක සුරා බද්දක් ද, මසකට ලීටර් 20,000 සීමාවෙන් ඔබ්බට ලීටරයකට රුපියල් 500 ක සුරා බද්දක් ද පනවන ලදී.

[1] 2010 වසර තුළදී ක්‍රියාත්මක කරන ලද ප්‍රධාන ආර්ථික ප්‍රතිපත්තිමය වෙනස්වීම් සහ ක්‍රියාමාර්ග මෙයට ඇතුළත් වේ. 2011 වසරේ පළමු මාස තුන තුළදී ක්‍රියාත්මක කරන ලද සහ 2011 වසර තුළදී ක්‍රියාත්මක කිරීමට අපේක්ෂිත ප්‍රතිපත්තිමය වෙනස්කම් හා ක්‍රියාමාර්ග ද මීට ඇතුළත් වේ.

| | | |
|---|---|---|
| 2010 පෙබරවාරි 25 | - | මෝල්ට් සාරය ආනයනය සඳහා ලබා දුන් සම්පූර්ණ තීරු බදු අත්හැරීම තවදුරටත් දීර්ඝ කරන ලදී. |
| 2010 මාර්තු 01 | - | රත්‍රන් ආනයනය මත පනවා තිබූ සියලුම බදු සහ අනෙකුත් අයකිරීම් ඉවත් කරන ලදී. |
| 2010 මාර්තු 20 | - | සහල් ආනයනය මත වූ විශේෂ වෙළෙඳ භාණ්ඩ බද්ද ඉවත් කළ අතර, අනෙකුත් අදාල බදු සහ අයකිරීම් නැවත පනවන ලදී. |
| 2010 මාර්තු 21 | - | සීනි ආනයනය මත අයකළ කිලෝග්‍රෑමයට රුපියල් 1 ක විශේෂ වෙළෙඳ භාණ්ඩ බද්ද තවත් මාස තුනකට දීර්ඝ කරන ලදී. |
| 2010 මැයි 1 | - | තිරිඟු ඇට ආනයනය සඳහා පනවා තිබූ සම්පූර්ණ තීරු බදු අත්හැරීම කිලෝග්‍රෑමයට රුපියල් 8 දක්වා අඩු කළ අතර, බලපවත්නා අදාළ තීරු බද්ද කිලෝග්‍රෑමයට රුපියල් 2 ක් වේ. |
| 2010 මැයි 10 | - | වියලි හාල්මැස්සන්, අර්තාපල්, ලොකු ළූණු, රතු ළූණු, මෑ වර්ගයේ ඇට, කොණ්ඩ කඩල, පරිප්පු, මුං ඇට, වියලි මිරිස් සහ ටින් මාළු ආනයනය කිරීමේදී අය කළ විශේෂ වෙළෙඳ භාණ්ඩ බද්ද පැවති අනුපාතයෙන්ම තවත් මාස තුනක කාලයක් සඳහා දීර්ඝ කරන ලදී. |
| 2010 ජුනි 01 | - | කාණ්ඩ පහක තීරු බදු ව්‍යුහය (සියයට 0, 2.5, 6, 15 සහ 28) කාණ්ඩ හතරක තීරු බදු ව්‍යුහයක් (සියයට 0, 5, 15 සහ 30) දක්වා අඩු කරන ලදී. |
| | - | ආනයන මත පනවා තිබූ සියයට 15 ක තීරු බදු අධිභාරය ඉවත් කරන ලදී. |
| | - | වැඩි වශයෙන් ආනයනික අමු ද්‍රව්‍ය සහ යන්ත්‍රෝපකරණ මත පනවා තිබූ සියයට 2.5 ක තීරු බද්ද ඉවත් කරන ලදී. |
| | - | මෝටර් වාහන ආනයනය මත වූ සෙස් බද්ද ඉවත් කරන ලදී. |
| | - | මෝටර් වාහන ආනයනය මත වූ නිෂ්පාදන බද්ද අඩු කරන ලදී. |
| | - | යතුරුපැදි ආනයනය මත වූ තීරු බදු සියයට 15 සිට සියයට 5 දක්වා අඩුකළ අතර, යතුරුපැදි ආනයනය මත සියයට 25 ක නිෂ්පාදන බද්දක් පනවන ලදී. |
| | - | තෝරාගත් විදුලි උපකරණ සහ ඒවායේ අමතර කොටස් ආනයනය මත වූ තීරු බද්ද, එකතු කළ අගය මත බද්ද, සමාජ වගකීම් බද්ද, සෙස් බද්ද සහ නිෂ්පාදන බද්ද යන බදු ඉවත් කරන ලදී. එබැවින්, එම භාණ්ඩ සඳහා වරාය සහ ගුවන් තොටුපොළ සංවර්ධන බද්ද සහ ජාතිය ගොඩනැගීමේ බද්ද පමණක් බලපැවැත්වේ. |
| | - | ශීතකරණ, අධි ශීතකරණ, බඳුන් සේදීමේ යන්ත්‍ර, රෙදි සේදීමේ යන්ත්‍ර, අත් ඔරලෝසු, සාක්කු ඔරලෝසු හා අනෙකුත් ඔරලෝසු වර්ග සහ ඒවායේ අමතර කොටස් සඳහා පනවන ලද සෙස් බද්ද ඉවත් කරන ලදී. |
| | - | ආනයනික පින්තාරු තීන්ත සහ වාර්නිෂ් මත වූ නිෂ්පාදන බද්ද ඉවත් කරන ලදී. |
| | - | ආනයනික පින්තාරු තීන්ත, වාර්නිෂ් සහ පිරවුම් සඳහා යොදන තීන්ත වර්ගයන්හි සෙස් බද්ද කිලෝග්‍රෑමයට රුපියල් 85 ක සිට කිලෝග්‍රෑමයට රුපියල් 50 දක්වා අඩු කරන ලදී. |
| | - | මුද්‍රණ තීන්ත ආනයනය මත වූ සෙස් බද්ද කිලෝග්‍රෑමයට රුපියල් 25 සිට කිලෝග්‍රෑමයට රුපියල් 15 දක්වා අඩු කරන ලදී. |
| | - | තෝරාගත් රූපලාවන්‍ය කටයුතු සඳහා යොදාගන්නා ද්‍රව්‍ය හා කොණ්ඩා සැකසීම සඳහා උපයෝගි කරගන්නා ඇතැම් ද්‍රව්‍ය ආනයනය මත වූ සෙස් බදු අනුපාතය සියයට 35 හෝ කිලෝග්‍රෑමයකට රුපියල් 250 යන දෙකෙන් ඉහළ අගය දක්වා සංශෝධනය කරන ලදී. |
| | - | කාර්මික මොනොකාබොක්සිලික් මේද අම්ල, පිරිසිදු කළ ලිපිඩ අම්ල සහ කාර්මික ලිපිඩ මද්‍යසාර මත වූ සෙස් බද්ද ඉවත් කරන ලදී. |

- ආනයනික රෙසින, සෙලියුලෝස් සහ එහි රසායනික ව්‍යුත්පන්න, ප්ලාස්ටික් වර්ග සහ එතිලීන් හි බහුඅවයවික, ප්‍රොපිලින්, ස්ටයරින්, විනිල් ක්ලෝරයිඩ, විනිල් ඇසිටේට්, ඇක්‍රලික් පොලිමර්ස්, පොලිඇසිටල්, අනෙකුත් පොලියෙස්ටර් සහ ප්‍රාථමික ස්වරූප දරණ පොලිඇමයිඩ සඳහා බලපාන සෙස් බදු අනුපාතය සියයට 10 සිට 5 දක්වා අඩු කරන ලදී.
- සිමෙන්ති ආනයනය මත වූ සෙස් බද්ද සියයට 10 සිට සියයට 8 දක්වා අඩු කරන ලදී.
- පාෂාණවලින් කරන ලද ස්මාරක හෝ පිඟන් ගඩොල්, ග්‍රැනයිට් සහ කිරිගරුඬ වැනි ගොඩනැගිලි සෑදීමට ගන්නා පාෂාණ වර්ගවල ආනයනික සෙස් බද්ද කිලෝග්‍රෑමයට රුපියල් 50 හෝ සියයට 30 සිට කිලෝග්‍රෑමයට රුපියල් 30 හෝ සියයට 20 දක්වා අඩුකරන ලද අතර අදාළ අනුපාත දෙකෙන් ඉහළ අගය අයකරනු ලැබේ.
- යකඩ හෝ පිරිසිදු වානේ වලින් නිමකළ ඇතැම් භාණ්ඩ වර්ගවල ආනයනික සෙස් බද්ද කිලෝග්‍රෑමයට රුපියල් 10 සිට කිලෝග්‍රෑමයට රුපියල් 15 දක්වා වැඩි කරන ලදී.
- යකඩ හෝ අමිශ්‍ර ලෝහ වලින් තැනූ තන්තු, මල නොබැඳෙන වානේ සහ යකඩ හෝ අමිශ්‍ර ලෝහ වලින් තැනූ විවිධ හැඩ, විවිධ කෝණ සහ විවිධ කාණ්ඩ (U කාණ්ඩ, I කාණ්ඩ, H කාණ්ඩ) වලට අයත් ආනයනය මත වූ සෙස් බද්ද ඉවත් කරන ලදී.

  ව්‍යවහාර මුදල් (සං.ව. සංකේතය 4907.00.90) ආනයනය මත පනවා තිබූ එකතු කළ අගය මත බද්ද, ජාතිය ගොඩනැගීමේ බද්ද සහ වරාය සහ ගුවන් තොටුපොළ සංවර්ධන බද්ද ඉවත් කරන ලදී.

2010 ජුනි 21

- සීනි ආනයනය සඳහා අයකළ විශේෂ වෙළෙඳ භාණ්ඩ බද්ද ඉදිරි මාස තුන සඳහා කිලෝග්‍රෑමයට රුපියල් 1 සිට කිලෝග්‍රෑමයට රුපියල් 5 දක්වා වැඩි කරන ලදී.
- තිරිඟු ඇට ආනයනය සඳහා වූ කිලෝග්‍රෑමයකට රුපියල් 8 ක තීරු බදු අත්හැරීම ඉවත් කරන ලදී. එබැවින් සියයට 15 ක් හෝ කිලෝග්‍රෑමයට රුපියල් 10 ක් යන දෙකෙන් ඉහළ අගය තීරු බදු ලෙස අය කෙරේ.

2010 ජූලි 08

- ඉහළ තාක්ෂණයෙන් යුත් වෛද්‍ය උපකරණ ආනයන මත වූ එකතු කළ අගය මත බද්ද අහෝසි කරන ලදී.

2010 අගෝස්තු 10

- රතු ළූණු සහ ලොකු ළූණු ආනයනය සඳහා අයකළ විශේෂ වෙළෙඳ භාණ්ඩ බද්ද කිලෝග්‍රෑමයට රුපියල් 10 සිට කිලෝග්‍රෑමයට රුපියල් 25 දක්වා වැඩි කරන ලදී.
- සුදු ළූණු ආනයනය සඳහා අයකළ විශේෂ වෙළෙඳ භාණ්ඩ බද්ද කිලෝග්‍රෑමයට රුපියල් 30 සිට කිලෝග්‍රෑමයට රුපියල් 10 දක්වා අඩු කරන ලදී.
- ආනයනික පියළි නොකළ මෑ වර්ගයේ ඇට සහ පියළි නොකළ කොණ්ඩ කඩල සඳහා වූ විශේෂ වෙළෙඳ භාණ්ඩ බද්ද කිලෝග්‍රෑමයට රුපියල් 15 සිට කිලෝග්‍රෑමයට රුපියල් 10 දක්වා අඩු කරන ලදී.
- ආනයනික පියළි නොකළ මයිසූර් පරිප්පු සහ පියළි කළ මයිසූර් පරිප්පු සඳහා වූ විශේෂ වෙළෙඳ භාණ්ඩ බද්ද පිළිවෙළින් කිලෝග්‍රෑමයට රුපියල් 1 සිට කිලෝග්‍රෑමයට රුපියල් 10 දක්වා සහ කිලෝග්‍රෑමයට රුපියල් 2 සිට කිලෝග්‍රෑමයට රුපියල් 15 දක්වා වැඩිකරන ලදී.
- වියළි හාල් මැස්සන්, අර්තාපල්, පියළි කළ මෑ වර්ගයේ ඇට, පියළි කළ කොණ්ඩ කඩල, මුං ඇට, වියළි මිරිස් සහ ටින් මාළු ආනයනය කිරීමේදී අයකළ විශේෂ වෙළෙඳ භාණ්ඩ බද්ද පැවති අනුපාතයෙන්ම තවත් මාස හතරක කාලයක් සඳහා දීර්ඝ කරන ලදී.

2010 අගෝස්තු 16

- 1209.99.10 සං.ව. සංකේතය යටතේ ආනයනය කරන පළතුරු ඇට වර්ග සඳහා අයකළ එකතු කළ අගය මත බද්ද ඉවත් කරන ලදී.

2010 අගෝස්තු 27

- 2010 සැප්තැම්බර් 9 වන දින දක්වා බලපවත්වන පරිදි අර්තාපල් සඳහා කිලෝග්‍රෑමයට රුපියල් 20 ක අධිභාරයක් පනවන ලදී.

| | | |
|---|---|---|
| 2010 සැප්තැම්බර් 10 | - | අර්තාපල් ආනයනය කිරීමේදී අයකළ විශේෂ වෙළෙඳ භාණ්ඩ බද්ද ඉදිරි මාස තුන සඳහා කිලෝග්‍රෑමයට රුපියල් 10 සිට කිලෝග්‍රෑමයට රුපියල් 30 දක්වා වැඩි කරන ලදී. |
| 2010 සැප්තැම්බර් 21 | - | සීනි ආනයනය කිරීමේදී අයකළ කිලෝග්‍රෑමයට රුපියල් 5 ක විශේෂ වෙළෙඳ භාණ්ඩ බද්ද තවත් මාස තුනක කාලයක් සඳහා දීර්ඝ කරන ලදී. |
| 2010 ඔක්තෝබර් 13 | - | අභිජනනය සහ අනෙකුත් කාර්යයන් සඳහා කුකුළු පැටව් ආනයනයේදී අය කළ තීරු බද්ද, එකතු කළ අගය මත බද්ද, සමාජ වගකීම් බද්ද, සෙස් බද්ද, වරාය සහ ගුවන් තොටුපොළ සංවර්ධන බද්ද සහ ජාතිය ගොඩනැගීමේ බද්ද ඉවත් කරන ලදී. |
| | - | ආනයනික බිත්තර සහ බිත්තර කහ මද සඳහා අයකළ තීරු බද්ද, එකතු කළ අගය මත බද්ද, සමාජ වගකීම් බද්ද සහ සෙස් බද්ද ඉවත් කරන ලදී. |
| | - | කුකුළු මස් ආනයනය සඳහා වූ එකතු කළ අගය මත බද්ද, සමාජ වගකීම් බද්ද සහ සෙස් බද්ද ඉවත් කරන ලද අතර, තීරු බද්ද සියයට 30 සිට සියයට 15 දක්වා අඩු කරන ලදී. |
| 2010 ඔක්තෝබර් 30 | - | ලොකු ළූණු ආනයනය සඳහා අයකළ විශේෂ වෙළෙඳ භාණ්ඩ බද්ද කිලෝග්‍රෑමයට රුපියල් 25 සිට කිලෝග්‍රෑමයට රුපියල් 10 දක්වා අඩු කරන ලදී. |
| | - | අර්තාපල් සඳහා අයකළ විශේෂ වෙළෙඳ භාණ්ඩ බද්ද කිලෝග්‍රෑමයට රුපියල් 30 සිට කිලෝග්‍රෑමයට රුපියල් 10 දක්වා අඩු කරන ලදී. |
| | - | ආහාරයට ගන්නා ඇතැම් වර්ගවලට අයත් තෙල් වර්ග සහ ඒවායේ කොටස් ආනයනය සඳහා කිලෝග්‍රෑමයට රුපියල් 45 ක හෝ සියයට 15 ක තීරු බදු අත්හැරීමක් ලබාදෙන ලදී. |
| 2010 නොවැම්බර් 23 | - | කුකුළු මස් ආනයනය සඳහා කිලෝග්‍රෑමයට රුපියල් 150 ක බදු අත්හැරීමක් ලබා දුන් අතර, බලපවත්නා අදාළ බදු අනුපාතය කිලෝග්‍රෑමයට රුපියල් 50 කි. |
| | - | කුරුළු බිත්තර ආනයන සඳහා කිලෝග්‍රෑමයට රුපියල් 100 ක සම්පූර්ණ ආනයනික බදු අත්හැරීමක් ලබා දෙන ලදී. |
| | - | පෙට්‍රල්, ගල් අඟුරු සහ බිටුමන් ආනයනය සහ සැපයුම, එකතු කළ අගය මත බද්දෙන් නිදහස් කරන ලදී. |
| | - | ශ්‍රී ලංකා රේගුව භාවිතා කළ බදු සමීකරණ වෙනස් කරන ලදී. |
| | - | පෙට්‍රල් ආනයනයේ දී ලබාදෙන ලද සම්පූර්ණ තීරුබදු අත්හැරීම ලීටරයකට රුපියල් 20 ක් දක්වා අඩු කළ අතර, මෙතැන් සිට අදාළ බදු අනුපාතය ලීටරයට රුපියල් 15 කි. |
| | - | ඩීසල් ආනයනයේ දී ලබාදෙන ලද සම්පූර්ණ තීරුබදු අත්හැරීම ලීටරයකට රුපියල් 11 ක් දක්වා අඩු කළ අතර, මෙතැන් සිට අදාළ බදු අනුපාතය ලීටරයකට රුපියල් 4 කි. |
| | - | ලොතරැයි පත් සහ දුරකථන කාඩ්පත් ආනයනය සඳහා කිලෝග්‍රෑමයකට රුපියල් 600 ක සෙස් බද්දක් පනවන ලදී. |
| | - | සං.වි. ශීර්ෂයන් 30.01, 30.02, 30.03, 30.04 සහ 30.06 යටතේ තිබෙන ඖෂධීය නිෂ්පාදන, වරාය සහ ගුවන් තොටුපොළ සංවර්ධන බද්දෙන් නිදහස් කරන ලදී. |
| | - | මෝටර් වාහන ආනයනයේ දී විද්‍යුත් හා ඉන්ධන යන දෙවර්ගයම භාවිතා කළ හැකි වාහන සඳහා පැවති තීරු බද්ද සහ නිෂ්පාදන බද්ද සංශෝධනය කරන ලදී. |
| | - | විදුලි උපකරණ සහ යන්ත්‍ර ආනයනය සඳහා පැවති තීරු බද්ද සංශෝධනය කරන ලදී. |
| | - | 1977 නොවැම්බර් මස 15 දින නිකුත් කරන ලද අංක 291/7 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ ප්‍රකාශයට පත් කළ 1977 අංක 1 දරණ විශේෂ ආනයන බලපත්‍ර රෙගුලාසි සංශෝධනය කරන ලදී. |

| | | |
|---|---|---|
| | - | විදුලි සංදේශ/තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ/ව්‍යාපාර ක්‍රියාවලි බාහිරකරණය යන අංශ, කෘෂිකාර්මික ක්ෂේත්‍රය, රසකැවිලි සහ බේකරි නිෂ්පාදන, සෞඛ්‍ය, ඖෂධ, විලේපන (ආයුර්වේද ඇතුළුව), සංචාරක හා ඉදිකිරීම් කර්මාන්ත, ජාත්‍යන්තර ප්‍රචලිත වෙළෙඳ නාම සහිත භාණ්ඩ, වාහන එකලස් කිරීමේ කර්මාන්ත, සෞඛ්‍ය, අධ්‍යාපන සහ විද්‍යාත්මක පර්යේෂණ සඳහා අවශ්‍ය මෙවලම් හා උපකරණ, සඳහා තීරු බදු අඩු කරන ලදී. |
| 2010 දෙසැම්බර් 10 | - | වියළි හාල් මැස්සන්, අර්තාපල්, ලොකු ළූණු, මෑ වර්ගයේ ඇට, කොණ්ඩ කඩල, මුං ඇට, මයිසූර් පරිප්පු, ටින් මාළු, සීනි, රතු ළූණු හා සුදු ළූණු සඳහා වූ විශේෂ වෙළෙඳ භාණ්ඩ බද්ද පෙර පැවැති අනුපාතයන්ගෙන්ම තවත් මාස 4 ක කාලයක් සඳහා දීර්ඝ කරන ලදී. |
| | - | ඩීසල් ආනයනය සඳහා සම්පූර්ණ තීරු බදු අත්හැරීමක් ලබා දුන් අතර එය 2010 නොවැම්බර් මස 23 දින සිට බලපැවැත්වේ. |
| 2010 දෙසැම්බර් 22 | - | 1977 නොවැම්බර් මස 15 දින නිකුත් කරන ලද අංක 291/7 දරණ අති විශේෂ ගැසට් පත්‍රයේ ප්‍රකාශයට පත් කළ 1977 අංක 1 දරණ විශේෂ ආනයන බලපත්‍ර රෙගුලාසි තවදුරටත් සංශෝධනය කරන ලදී. |
| 2011 ජනවාරි 01 | - | මුදල් අමාත්‍යවරයාගේ අනුමැතිය යටතේ රජයේ අමාත්‍යාංශවලට ඍජුවම ලැබෙන විදේශ ණය හෝ පරිත්‍යාග මත ක්‍රියාත්මක වන යටිතල පහසුකම් සංවර්ධන ව්‍යාපෘතීන්වලට ආනයනය කරන භාණ්ඩ, ජාතිය ගොඩනැගීමේ බද්ද සහ එකතු කළ අගය මත බද්දෙන් නිදහස් කරන ලදී. |
| | - | මුදල් අමාත්‍යවරයාගේ අනුමැතිය යටතේ ආයුර්වේද නිෂ්පාදන සඳහා අවශ්‍ය වන ආනයනික අමුද්‍රව්‍ය සහ එම නිෂ්පාදන ඇසිරීමට භාවිතා කරන ඇසුරුම් ද්‍රව්‍ය (විලේපන සැකසීම් හැර) ජාතිය ගොඩනැගීමේ බද්දෙන් නිදහස් කරන ලදී. |
| | - | සං.ව. සංකේත 2713.20 සහ සං.ව. ශීර්ෂ 27.14 යටතේ ආනයනය කරන ලද බිටුමන් අඩංගු සංයෝග සහ සං.ව. සංකේත 8701.10.10, 8701.10.90, 8701.90.10 සහ 8701.90.20 යටතේ ආනයනය කරන ලද ට්‍රැක්ටර් වර්ග, ජාතිය ගොඩනැගීමේ බද්දෙන් නිදහස් කරන ලදී. |
| | - | සම් කර්මාන්තය හෝ පාවහන් කර්මාන්තය සඳහා භාවිතාවන ඇතැම් ආනයනික යන්ත්‍ර සහ උපකරණ, අධිතාක්ෂණික වෛද්‍ය, විද්‍යාගාර සහ අධ්‍යාපනික උපකරණ, කුලීරථ මීටර, කෘෂිකාර්මික යන්ත්‍ර හා කොටස්, විද්‍යුත් උපකරණ, විලාසිතා ආභරණ නිෂ්පාදන සඳහා භාවිතා කරන භාණ්ඩ, ගුවන් යානා ආකෘති හා කොටස් සහ සන්නිවේදනය සඳහා භාවිතා වන අධි තාක්ෂණික උපකරණ එකතු කළ අගය මත බද්දෙන් නිදහස් කරන ලදී. |
| 2011 ජනවාරි 11 | - | පෙට්‍රල් ආනයනය කිරීම සඳහා ලබා දුන් තීරු බදු අත්හැරීම ලීටරයකට රුපියල් 20 සිට ලීටරයකට රුපියල් 30 දක්වා වැඩිකරන ලද අතර, බලපවත්නා තීරු බදු අනුපාතිකය ලීටරයකට රුපියල් 5 කි. |
| 2011 ජනවාරි 22 | - | කිරි පිටි ආනයන සඳහා සම්පූර්ණ තීරු බදු අත්හැරීමක් ප්‍රදානය කරන ලද අතර, මෙතැන් සිට වරාය සහ ගුවන් තොටුපොළ සංවර්ධන බද්ද සහ ජාතිය ගොඩනැගීමේ බද්ද පමණක් බලපැවැත්වේ. |

**විදේශ විනිමය කළමනාකරණය**

| | | |
|---|---|---|
| 2010 මාර්තු 11 | - | පහත දැක්වෙන කාණ්ඩයන්ට අයත් නේවාසික ශ්‍රී ලාංකිකයන්ට එතෙර බැංකුවල ගිණුම් ආරම්භ කිරීමට සහ පවත්වාගෙන යාමට අවසර ලබාදෙන ලදී: |

- ව්‍යාපාර, අධ්‍යයන හෝ වෛද්‍ය ප්‍රතිකාර කටයුතු සඳහා තාවකාලිකව ශ්‍රී ලංකාවෙන් පිටතට ගමන් කළ ශ්‍රී ලංකාවේ නේවාසික පුද්ගලයෙකු
- ශ්‍රී ලංකාවේ නේවාසිකයෙකුව සිටිමින් ශ්‍රී ලංකාවෙන් පිටතට වෘත්තීමය සේවාවන් සපයන පුද්ගලයෙකු හෝ ශ්‍රී ලංකාවේ ලියාපදිංචි සමාගමක් හෝ ආයතනයක්

- ශ්‍රී ලංකාවෙන් පිටත ආයෝජනය කිරීම සඳහා ගරු මුදල් අමාත්‍යතුමා විසින් අවසර ලබා දුන් පුද්ගලයෙකු හෝ ශ්‍රී ලංකාවේ ලියාපදිංචි සමාගමක් හෝ ආයතනයක්
- විදේශ මුදලින් එතෙර දී ණය දීම සඳහා ශ්‍රී ලංකා මහ බැංකුව විසින් අවසර ලබාදුන් පුද්ගලයෙකු හෝ ශ්‍රී ලංකාවේ ලියාපදිංචි සමාගමක් හෝ ආයතනයක් සහ
- වෙළෙඳ භාණ්ඩ අපනයනකරුවෙක්.

\- අනේවාසිකයන් විසින් වාණිජ බැංකුවල දැනට පවත්වාගෙන යනු ලබන විවිධාකාර ආයෝජන ගිණුම් එනම්, කොටස් ආයෝජන බාහිර රුපියල් ගිණුම් (SIERA), භාණ්ඩාගාර බැඳුම්කර ආයෝජන බාහිර රුපියල් ගිණුම් (TIERA), භාණ්ඩාගාර බිල්පත් ආයෝජන බාහිර රුපියල් ගිණුම් (TIERA-2) සහ භාණ්ඩාගාර බිල්පත්/බැඳුම්කර ආයෝජන බාහිර රුපියල් ගිණුම් - දේශාභිමානී (TIERA-D), ඒකාබද්ධ කිරීමට අවසර ලබාදෙන ලදී. ඒකාබද්ධිත ගිණුම, සුරැකුම්පත් ආයෝජන ගිණුම (SIA) ලෙස නැවත නම් කරන ලදී.

\- ගනුදෙනුකරුවන් විනිමය අවදානම්වලට නිරාවරණය වූ අවස්ථාවල දී එයින් ආරක්ෂා කිරීම සඳහා බලයලත් අලෙවිකරුවන් හට විදේශ ව්‍යවහාර මුදලින් වන ඉදිරි ගිවිසුම්වලට එළඹීමට තිබූ සීමා ලිහිල් කරන ලදී.

\- පූර්ව ගෙවීමේ පදනම මත ආනයනය කිරීමේදී, තෝරාගත් අයිතමයන්ගේ ඉන්වොයිස් වටිනාකම මත වූ සියයට 100 ක ආන්තික තැන්පතු අවශ්‍යතාවය ඉවත් කරන ලදී.

\- ආනයන බිල්පත් කල් පිරීමට පෙර ගෙවා නිදහස් කිරීමට තිබූ බාධක ඉවත් කරන ලදී.

\- ශ්‍රී ලංකාව තුළ අක්වෙරළ ඒකකයන්හි පවත්වාගෙන යනු ලබන ගිණුම් හා විශේෂ විදේශ ආයෝජන තැන්පතු ගිණුම් අතර අරමුදල් මාරු කිරීම සඳහා අනේවාසිකයන්ට අවසර ලබාදෙන ලදී.

**2010 මැයි 07**

\- බලයලත් අලෙවිකරුවන් හට "ජාත්‍යන්තර සේවා සපයන්නන් සහ ඔවුන්ගේ සේවා නියුක්තිකයන් සඳහා විදේශ ව්‍යවහාර මුදල් ගිණුම් (FCAISPE)" නමින් නවතම විදේශ ව්‍යවහාර මුදල් ගිණුමක් ඇරඹීමට අවසර ලබාදෙන ලදී.

**2010 ජුනි 02**

\- ශ්‍රී ලාංකිකයන්ගේ එතෙර සංචාර සඳහා වූ ගමන් දීමනාවේ කොටසක් වන විදේශ ව්‍යවහාර මුදල් නෝට්ටු නිකුතුව වර්තමාන මට්ටම වන එ.ජ.ඩොලර් 2,000 සිට එ.ජ.ඩොලර් 2,500 දක්වා හෝ එයට සමාන ඕනෑම හුවමාරු කළ හැකි වෙනත් විදේශ මුදල් ඒකකයක් දක්වා ඉහළ නංවන ලදී.

**2010 නොවැම්බර් 22**

\- විදේශ සමාගම්වලට ශ්‍රී ලංකාවේ ව්‍යාපාර ස්ථාන ආරම්භ කිරීමට අවසර ලබාදෙන ලදී.

\- දේශීය සමාගම්වල රුපියල් වලින් මිල කරන ලද ණයකරවල ආයෝජනය කිරීමට විදේශිකයන්ට අවසර ලබා දෙන ලදී.

\- ආනයන සඳහා ගෙවිය යුතු අත්තිකාරම් මුදල එ.ජ.ඩොලර් 10,000 සිට එ.ජ.ඩොලර් 50,000 දක්වා ඉහළ නංවන ලදී.

\- ශ්‍රී ලංකා රුපියල් වලින් හා විදේශීය මුදල් වලින් විවිධාකාර බැංකු කටයුතුවල නියුක්ත වීමට, රාජ්‍ය තාන්ත්‍රික පුද්ගලයන්ට, ඔවුන්ගේ පවුල්වල සාමාජිකයන්ට හා රාජ්‍ය තාන්ත්‍රික දූත කණ්ඩායම්වලට ඉඩ ලබා දෙන ලදී.

\- තාවකාලික සංචාර සඳහා ලංකාවට පැමිණෙන හෝ පැමිණීමට බලාපොරොත්තු වන විජාතිකයින්ට අනේවාසික විජාතික විදේශ මුදල් ගිණුම් විවෘත කිරීමට අවසර ලබා දෙන ලදී.

\- මැණික් හා ස්වර්ණාභරණ ආනයනය කරන්නන් හට විදේශ මුදල්වලින් ගිණුම් ඇරඹීමට ඉඩ ප්‍රස්ථා ලබා දෙන ලදී.

\- විදේශ මූලාශ්‍ර වලින් ණය ලබාගැනීමට සමාගම් වලට අනුමැතිය ලබා දෙන ලදී.

| | | |
|---|---|---|
| 2011 ජනවාරි 01 | - | ශ්‍රී ලාංකීය නේවාසිකයන්ට සහ ශ්‍රී ලංකාවේ සංස්ථාගත සමාගම්වලට, විදේශීය සමාගම්හි කොටස්වල සහ විදේශීය රජයන් මගින් නිකුත් කර ඇති ස්වෛරීත්ව බැඳුම්කරවල ආයෝජනය කිරීමට අවසර ලබාදෙන ලදී. |
| | - | ශ්‍රී ලාංකීය සමාගම් සහ හවුල් ව්‍යාපාරවලට විදේශයන් හි ව්‍යාපාර ආරම්භ කිරීමට අවසර ලබා දෙන ලදී. |

**අපේක්ෂිත**

| | | |
|---|---|---|
| | - | සංස්ථාපිත ණය කාඩ්පත්/සංචාරක කාඩ්පත් හඳුන්වා දීම. |
| | - | නේවාසික හා අනේවාසික ගිණුම්වල පවතින අරමුදල් පුද්ගලයන් හෝ බැංකු අතර හුවමාරු කිරීමට බැංකුවලට පොදු අවසරයක් ලබා දීම. |
| | - | වක්‍ර නිර්යාතකරුවන්ගේ විදේශ විනිමය ගිණුම්වල ශේෂයන්ගේ උපරිම සීමාවන් ඉවත් කිරීම. |
| | - | සංචාරක නියෝජිතයන්, ගුවන් සමාගම්, විදේශයන්හි බලශක්ති ව්‍යාපෘති සහ ගොඩනැගිලි ඉදිකිරීම වැනි ව්‍යාපෘති සිදු කරන දේශීය සමාගම් සහ විදේශ අරමුදල් මගින් ශ්‍රී ලංකාවේ පවත්වාගෙන යන ව්‍යාපෘති සිදු කරන දේශීය සමාගම් සඳහා විශේෂ විදේශ විනිමය ගිණුම් හඳුන්වා දීම. |
| | - | විදේශිකයන් සහ විදේශ අරමුදල් මගින් ඒකක භාරයන්හි කරන ලද ආයෝජනයන් සඳහා විනිමය පාලන සීමාවන් ලිහිල් කිරීම. |
| | - | වර්තමාන සංවර්ධනයන්ට සමගාමීව අධ්‍යාපනය, සංචාරක නියෝජිතායතන සහ නැව් නියෝජිතායතන යන සේවාවන් තවදුරටත් පුළුල් කිරීම සඳහා එවැනි සේවාවන් සඳහා විදේශ ආයෝජන සම්බන්ධයෙන් වන සීමාවන් ලිහිල් කිරීම. |
| | - | ලංකාවේ පවතින ඉඩම් මිලදී ගැනීමට අදාළව අනේවාසිකයන්ට ගෙවීම් කිරීම සඳහා නේවාසිකයන්ට පොදු අවසරයක් ලබාදීම. |
| | - | අධ්‍යාපන කටයුතු සඳහා විදේශ ගතවන ශ්‍රී ලාංකික ශිෂ්‍යයන්ට අදාළ රටවලින් ණය ලබාගැනීමට අවසර ලබාදීම. |

## රාජ්‍ය මූල්‍ය අංශය

**රාජ්‍ය ආදායම**

| | | |
|---|---|---|
| 2010 ජනවාරි 01 | - | එල්.පී. ගෑස් සඳහා වූ නිෂ්පාදන බද්ද සියයට 5 ක් හෝ කිලෝග්‍රෑමයට රුපියල් 31.50 සිට සියයට 5 ක් හෝ කිලෝග්‍රෑමයට රුපියල් 8.70 යන දෙකෙන් ඉහළ අගය අයකර ගැනීමට හැකිවන පරිදි අඩු කරන ලදී. |
| 2010 මාර්තු 01 | - | එල්.පී. ගෑස් මත පනවා තිබූ නිෂ්පාදන බද්ද ඉවත් කරන ලදී. |
| 2010 ජූනි 24 | - | දුම්වැටි මත පනවා තිබූ නිෂ්පාදන බද්ද වැඩි කරන ලදී. |
| 2010 සැප්තැම්බර් 01 | - | එල්.පී. ගෑස් සඳහා කිලෝග්‍රෑමයට රුපියල් 13.12 ක නිෂ්පාදන බද්දක් නැවත පනවන ලදී. |
| 2010 ඔක්තෝබර් 29 | - | දුම්වැටි මත පනවා තිබූ නිෂ්පාදන බද්ද වැඩිකරන ලදී. |
| | - | එල්.පී. ගෑස් සඳහා නිෂ්පාදන බද්ද කිලෝග්‍රෑමයට රුපියල් 13.12 සිට කිලෝග්‍රෑමයට රුපියල් 15.66 දක්වා වැඩි කරන ලදී. |
| 2010 නොවැම්බර් 19 | - | විදුලි සංදේශ සේවාවන් සඳහා වූ පරිසර සංරක්ෂණ බද්ද ඉවත් කරන ලදී. |
| 2010 නොවැම්බර් 23 | - | ආදායම් බදු හැර අනෙකුත් සියළු බදු කෙරෙහි බලපෑ සමාජ වගකීම් බද්ද ඉවත් කරන ලදී. |
| | - | මත්පැන් සඳහා වූ සුරා බදු වැඩි කරන ලදී. |

| | | |
|---|---|---|
| | - | මත්පැන් නිෂ්පාදනය සහ විකිණීම සඳහා ගෙවිය යුතු ආරක්ෂණ තැන්පතු සහ වාර්ෂික බලපත්‍ර ගාස්තු සංශෝධනය කරන ලදී. |
| | - | දුම්වැටි මත පනවා තිබූ නිෂ්පාන බද්ද වැඩි කරන ලදී. |
| 2010 දෙසැම්බර් 01 | - | ලැබෙන විදේශීය දුරකථන ඇමතුම් මත මිනිත්තුවකට රුපියල් 2 ක බද්දක් සියලු විදුලි සංදේශ සේවාවන් සඳහා පනවන ලදී. |
| 2010 දෙසැම්බර් 16 | - | එල්.පී. ගෑස් සඳහා නිෂ්පාදන බද්ද ඉවත් කරන ලදී. |
| 2011 ජනවාරි 01 | - | ශුන්‍ය අනුපාතය (Zero rate) අදාළ භාණ්ඩවලට හැර අනෙකුත් සියළුම භාණ්ඩ සඳහා සියයට 20 ක එකතු කළ අගය මත බදු අනුපාතය, සියයට 12 ක බදු අනුපාතයක් දක්වා අඩු කරන ලදී. |
| | - | සියයට 3 ක්ව පැවති ජාතිය ගොඩනැගීමේ බදු අනුපාතය සියයට 2 දක්වා අඩු කරන ලදී. |
| | - | ප්‍රාදේශීය යටිතල පහසුකම් සංවර්ධන බද්ද ඉවත් කරන ලදී. |
| | - | ජංගම දුරකථන ග්‍රාහක බද්ද, ජාතිය ගොඩනැගීමේ බද්ද, එකතු කළ අගය මත බද්ද වෙනුවට සියයට 20 ක සංයුක්ත විදුලි සංදේශන බද්දක් හඳුන්වා දෙන ලදී. |
| | - | විදුලි සංදේශ සේවා සැපයුම්කරුවන් සඳහා වාර්ෂික දළ පිරිවැටුම මත සියයට 2 ක සෙස් බද්දක් හඳුන්වා දෙන ලදී. |
| | - | පළාත් සභා මගින් එකතු කළ පිරිවැටුම් බද්ද ඉවත් කරන ලදී. |
| | - | දැනට පවතින සියයට 0.2 ක කොටස් ගනුදෙනු බද්ද සියයට 0.3 දක්වා වැඩි කරන ලදී. |
| 2011 ජනවාරි 05 | - | සැර මත්පැන් (මෝල්ට් මත්පැන් හැර සියළුම මත්පැන්) සඳහා වූ නිෂ්පාදන බද්ද සම්මත සැර මත්පැන් ලීටරයකට රුපියල් 50 කින් වැඩි කරන ලදී. |

**අපේක්ෂිත**

2011 අප්‍රේල් 01 - පුද්ගල ආදායම් බද්ද ගණනය කිරීමේ දී, බදු නිදහස් දීමනාව රුපියල් 300,000 සිට රුපියල් 500,000 දක්වා වැඩි කිරීම.

- ඒක පුද්ගල ආදායම් බද්ද සඳහා බලපවත්නා ආදායම් ස්ථරයන් සංශෝධනය කිරීම:

| | |
|---|---|
| පළමු රුපියල් 500,000 (බදු අයකළ හැකි ආදායමින්) | සියයට 4 |
| ඊළඟ රුපියල් 500,000 | සියයට 8 |
| ඊළඟ රුපියල් 500,000 | සියයට 12 |
| ඊළඟ රුපියල් 500,000 | සියයට 16 |
| ඊළඟ රුපියල් 1,000,000 | සියයට 20 |
| ශේෂය | සියයට 24 |

- උපයන විට ගෙවීම් බද්ද ගණනය කිරීම සඳහා බදු නිදහස් දීමනාව රුපියල් 500,000 සිට රුපියල් 600,000 දක්වා වැඩි කිරීම.
- රාජ්‍ය අංශයේ සේවකයින් සඳහා උපයන විට ගෙවීම් බද්ද හඳුන්වා දීම.
- සේවා නියුක්තියෙන් ලැබෙන ආදායම එකම ආදායම වන අවස්ථාවන්හි දී සේවා නියුක්තියෙන් ලැබෙන ආදායමෙන් (රජයේ සහ පුද්ගලික අංශයේ සේවකයන්ගේ) අය කර ගන්නා ලද උපයන විට ගෙවීම් බද්ද, අවසාන ආදායම් බද්ද ලෙස සැලකීම.
- දැනට ජ්‍යෙෂ්ඨ පුරවැසියන් සඳහා බලපැවැත්වෙන රාජ්‍ය බැංකුවල ඇති තැන්පතුවල පොලී ආදායම සඳහා රඳවා ගැනීමේ බද්දෙන් නිදහස් සීමාව රුපියල් 200,000 සිට රුපියල් 500,000 දක්වා වැඩි කිරීම.

- තනි පුද්ගලයන් හා පුණ්‍ය ආයතනවලට ස්ව-විධාන කාර්යයන්හි දී රඳවා ගැනීමේ බද්ද සඳහා බලපැවැත්වෙන තක්සේරු ආදායමේ පළමු මට්ටම රුපියල් 300,000 සිට රුපියල් 500,000 දක්වා වැඩි කිරීම.
- ස්ව-විධාන කාර්යයන්හි දී රඳවා ගැනීමේ බද්ද සඳහා බලපැවැත්වෙන තක්සේරු ආදායමේ දෙවන මට්ටම (දැනට සහනශීලී සියයට 2.5 ක බල පැවැත්වෙන) රුපියල් මිලියන 1 සිට රුපියල් මිලියන 1.5 දක්වා වැඩි කිරීම.
- සාංගමික ණය සුරැකුම්පත් මත රඳවා ගැනීමේ බද්ද රජයේ සුරැකුම්පත් මත රඳවා ගැනීමේ බද්ද හා සම මට්ටමේ සලකනු ලැබීම.
- නිශ්චිත ගාස්තු මත රඳවා ගැනීමේ බද්ද ඉවත් කිරීම.
- සමාගම් නොවන තැනැත්තන් සඳහා රඳවාගැනීමේ බදු අනුපාතය සියයට 8 දක්වා අඩු කිරීම.
- සමාගම් හෝ රාජ්‍ය නොවන සංවිධාන සම්බන්ධයෙන් පවත්නා සියයට 30, 33 1/3 හෝ 35 බදු අනුපාත, මත්පැන් හෝ දුම්කොළ නිෂ්පාදනය කිරීමේ හෝ ආනයනය කිරීමේ නිරතවන සමාගම් සඳහා හැර අනෙකුත් සමාගම්වලට සියයට 28 දක්වා අඩු කිරීම.
- මත්පැන් හෝ දුම්කොළ නිෂ්පාදන හෝ ආනයනය කිරීමෙහි නිරතවන තැනැත්තන් සඳහා අදාළවන සංස්ථාපිත ආදායම් බද්ද සියයට 40 දක්වා වැඩි කිරීම.
- සියයට 15 ක්ව පවත්නා සහනදායී සංස්ථාපිත ආදායම් බද්ද සියයට 12 දක්වා අඩු කිරීම.
- දේශීය එකතු කළ අගය සියයට 65 ක් ඉක්මවන සහ ශ්‍රී ලංකා සන්නම් නාමයක් සහිත පේටන්ට් හිමිකම ශ්‍රී ලංකාවේ පවතින යම් භාණ්ඩයක් නිෂ්පාදනය කිරීමේ ව්‍යවසායයක නිරත යම් තැනැත්තෙකු සඳහා බලපාන උපරිම සංස්ථාපිත ආදායම් බද්ද සීමා කිරීම.
- සමාජශාලා සහ සමිති, ගබඩා පහසුකම් ලබාදෙන හෝ පවත්වාගෙන යන ආයතන, දේශීය වශයෙන් මෘදුකාංග සංවර්ධනය කරන හෝ ශ්‍රම සැපයුම් කරන යම් ආයතන සඳහා බලපැවැත්වෙන සංස්ථාපිත ආදායම් බද්ද සියයට 10 දක්වා අඩු කිරීම.
- අවදානම් ප්‍රාග්ධන සමාගම්, ඛනිජ තෙල් ගවේෂණ සමාගම්, විනෝද කටයුතු සිදුකරන්නන් හෝ කලා ශිල්පීන් සඳහා අදාළ සංස්ථාපිත ආදායම් බද්ද සියයට 12 දක්වා අඩු කිරීම.
- හවුල් ව්‍යාපාරයක බෙදී යන ලාභය මත බලපැවැත්වෙන සංස්ථාපිත ආදායම් බද්ද සියයට 10 සිට සියයට 8 දක්වා අඩු කිරීම.
- දේශීය ආදායම් පනතේ 16 වෙනි වගන්තියේ සඳහන් යම් කෘෂිකාර්මික ව්‍යවසායක ලාභ සහ ආදායම් සඳහා බලපාන උපරිම සංස්ථාපිත ආදායම් බද්ද සියයට 10 කට සීමා කිරීම.
- මාළු ඇල්ලීම, කෘෂිකාර්මික බීජ හෝ වගා කිරීමට ගන්නා ද්‍රව්‍ය, වගා කිරීම සහ මූලික සකස් කිරීම යන ක්ෂේත්‍රයන් තක්සේරු වර්ෂයේ සිට වසර 5 ක් දක්වා සංස්ථාපිත ආදායම් බද්දෙන් නිදහස් කිරීම.
- කළමනාකරණය, මූල්‍ය, සැපයුම් දාම සහ මිල සටහන් කිරීම වැනි ක්‍රියාවන් සඳහා ශ්‍රී ලංකාවේ ප්‍රධාන කාර්යාල පවත්වාගෙන යන විදේශීය ගැනුම්කරුවන් සඳහා රෙදිපිළි, සම් ආශ්‍රිත නිෂ්පාදන, පාවහන් සහ මළු නිෂ්පාදනය කරන ආයතන කරනු ලබන සැපයුම් මගින් උපයන විදේශ විනිමය සංස්ථාපිත ආදායම් බද්දෙන් නිදහස් කිරීම.
- සී/ස ශ්‍රී ලංකන් ගුවන් සේවා සමාගම සහ සී/ස මිහින් ලංකා (පෞද්ගලික) ගුවන් සමාගම සියළුම ප්‍රභවයන්ගෙන් ලබන ආදායම් සම්බන්ධයෙන් වසර 10 ක් දක්වා ආදායම් බද්දෙන් නිදහස් කරනු ලබන අතර, මෙම ආයතනයන් වාර්ෂිකව ලබන දළ ලාභයෙන් සියයට 25 ක් වන ලාභාංශයක් රජයට ගෙවිය යුතු වීම.

- ලංකා විදුලි බල මණ්ඩලය, ජාතික ජල සම්පාදන සහ ජලපවාහන මණ්ඩලය, ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව සහ ශ්‍රී ලංකා වරාය අධිකාරිය යන ආයතනයන් සියළුම ප්‍රභවයන්ගෙන් ලබන ආදායම් වසර 5 ක් දක්වා ආදායම් බද්දෙන් නිදහස් කරනු ලබන අතර වාර්ෂික දළ ලාභයෙන් සියයට 25 ක් වන ලාභාංශයක් රජයට ගෙවිය යුතු වීම.
- ආර්ථික සේවා ගාස්තු පනතේ නිර්වචනය කර ඇති බෙදා හරින්නන්, ලොතරැයි නියෝජිතයන්, ඒකකභාර හෝ අන්‍යෝන්‍ය අරමුදල්, සියළුම ගුවන් සමාගම් සහ නැව් සමාගම්වල පිරිවැටුම ආර්ථික සේවා ගාස්තුවෙන් නිදහස් කිරීම.
- දැනට පවත්නා කාර්තුවකට රුපියල් මිලියන 7.5 ක් වූ ආර්ථික සේවා ගාස්තු බද්දට යටත් නොවන සීමාව රුපියල් මිලියන 25 දක්වා වැඩි කිරීම.
- කාර්තුමය පදනම මත ආර්ථික සේවා ගාස්තු බදු ගෙවීමට යටත්ව දැනට පවතින කාර්තුමය පදනම මත ආර්ථික සේවා ගාස්තු සඳහා වාර්තා සැපයීම, වාර්ෂික පදනම මත වාර්තා සැකසීමට වෙනස් කිරීම.
- කාණ්ඩ පහක ආර්ථික සේවා ගාස්තු ව්‍යුහය (සියයට 0.05, 0.1, 0.25, 0.5 සහ 1) කාණ්ඩ හතරක ව්‍යුහයක් (සියයට 0.1, 0.25, 0.5 සහ 1) බවට සරල කිරීම.
- හර බද්ද ඉවත් කිරීම.
- ආදායම් බදු මත බලපැවැත්වූ සමාජ වගකීම් බද්ද ඉවත් කිරීම.
- රටේ ආර්ථික සංවර්ධන අවශ්‍යතාව සලකා මුදල් අමාත්‍යවරයා විසින් කලින් කලට ගැසට් පත්‍රයේ පළකරනු ලබන නියෝගයක් මගින් නිශ්චිත වශයෙන් දක්වනු ලබන ක්‍රියාකාරකම් සඳහා එ.ජ.ඩොලර් මිලියන 3 කට නො අඩු (නමුත් එ.ජ.ඩොලර් මිලියන 10 කට නොවැඩි) සමාගමක් හෝ ඊට සමාන රුපියල්වලින් සමාගමක් විසින් ආයෝජිත නව ක්‍රියාකාරකම් සඳහා වසර 5 ක බදු විරාමයක් ලබා දීම.
- දේශීයව ලබාගන්නා ලද වී වලින් කෙරෙන සහල් නිෂ්පාදන විකුණුම් පිරිවැටුම මත වූ සියයට 1.5 ක ජාතිය ගොඩනැගීමේ සහනදායී බදු අනුපාතය ඉවත් කිරීම.

**රාජ්‍ය වියදම**

2010 ජනවාරි 01

- රජයේ සේවකයන්ගේ සහ රජයේ විශ්‍රාමිකයන්ගේ ජීවන වියදම් දීමනාව පිළිවෙලින් මසකට රුපියල් 5,250 දක්වා රුපියල් 750 කින් ද මසකට රුපියල් 2,375 දක්වා රුපියල් 375 කින් ද වැඩි කරන ලදී.

2011 ජනවාරි 01

- සෑම රජයේ සේවකයකුටම ඔවුන්ගේ මූලික වැටුපෙන් සියයට 5 ක විශේෂ දීමනාවක් ලබා දෙන ලදී.
- රජයේ සේවයේ සිටින මාණ්ඩලික නොවන ශ්‍රේණිය සඳහා වන ජීවන වියදම් දීමනාව මසකට රුපියල් 5,850 දක්වා රුපියල් 600 කින් වැඩි කරන ලදී.
- විශ්‍රාමිකයන් සඳහා වන මාසික ජීවන වියදම් දීමනාව මසකට රුපියල් 2,675 දක්වා රුපියල් 300 කින් වැඩි කරන ලදී.
- විශ්ව විද්‍යාල අධ්‍යයන කාර්ය මණ්ඩලයට ගෙවන "අධ්‍යයන දීමනාව", අධිකරණ සේවා කොමිසම යටතේ සිටින අධිකරණ සාමාජිකයන්ට ගෙවන "පෞද්ගලික දීමනාව", වෛද්‍යවරුන් සඳහා "ඇමතු විට පැමිණීම්" දීමනාව සියයට 25 කින් වැඩි කරන ලදී.

**අපේක්ෂිත**

- රජයේ සේවයේ මාණ්ඩලික ශ්‍රේණියේ සේවා නියුක්තිකයින් සඳහා වන ජීවන වියදම් දීමනාව 2011 ජූලි සිට බලපැවැත්වෙන පරිදි මසකට රුපියල් 5,850 දක්වා රුපියල් 600 කින් වැඩිකිරීම.
- 2011 ජූලි මාසයේ සිට බලපවත්වන පරිදි 2004 ජනවාරි 01 දිනට පෙර සහ 2004 ජනවාරි මස 01 දින සිට 2005 දෙසැම්බර් මස 31 දින දක්වා විශ්‍රාම ගිය විශ්‍රාමිකයන්ට පිළිවෙලින් රුපියල් 750 ක් හා රුපියල් 250 ක් මාසිකව වැඩි කිරීම.

**රාජ්‍ය ණය කළමනාකරණය**

| | | |
|---|---|---|
| 2010 මැයි 21 | - | 2014 වසර වනවිට BBB- ශ්‍රේණියේ හෝ ඊට ඉහළ ආයෝජන ශ්‍රේණිවලට ස්වෛරීත්ව ශ්‍රේණිගත කිරීම ඉහළ නැංවීමේ ක්‍රියාවලියට රාජ්‍ය හා පෞද්ගලික අංශයන්හි ක්‍රියාකාරී සහභාගිත්වය දිරිගැන්වීමේ අරමුණින් ස්වෛරීත්ව ශ්‍රේණිගත කිරීමේ කමිටුවක් පත්කරන ලදී. |
| 2010 ජූනි 30 | - | ලංකා ක්ලියර් සමාගමේ සේවා ස්ථානවලින් සිදුකළ රජයේ සුරැකුම්පත් හා සම්බන්ධ මෙහෙයුම් කටයුතු අත්හිටුවන ලදී. |
| 2010 ජූලි 09 | - | රටෙහි ස්වෛරීත්ව ශ්‍රේණිගත කිරීමේ ක්‍රියාවලිය ශක්තිමත් කිරීමේ අවශ්‍යතාවය පදනම් කර ගනිමින් රාජ්‍ය බලධාරීන් හා ශ්‍රේණිගත කිරීමේ ආයතන සම්බන්ධීකරණය කිරීම පිණිස බැන්ක් ඔෆ් ඇමෙරිකා මෙරිල්ලින්ච්, සීමාසහිත ස්කොට්ලන්ඩ් රාජකීය බැංකුව සහ සීමාසහිත එච් එස් බී සී බැංකුව යන ස්වෛරීත්ව ශ්‍රේණිගත කිරීම් උපදේශක ආයතන තුනක් නම් කරන ලදී. |
| 2010 අගෝස්තු 06 | - | මූඩීස් ආයෝජන ආයතන මගින් ස්වෛරීත්ව ශ්‍රේණිගත කිරීමක් ලබාගැනීමට තීරණය කරන ලදී. |
| 2010 ඔක්තෝබර් 04 | - | එ.ජ.ඩොලර් මිලියන 1,000 ක් වටිනා ජාත්‍යන්තර ස්වෛරීත්ව බැඳුම්කර නිකුත් කරන ලදී. |

**අපේක්ෂිත**

| | | |
|---|---|---|
| | - | යෝග්‍යතා නිර්ණායක සපුරන්නේ නම් වාණිජ බැංකුවලට ප්‍රාථමික වෙළෙඳපොළ කටයුතුවලට සහභාගිවීම සඳහාම වූ ප්‍රාග්ධනයක් නොමැතිව වුවද, ඒ සඳහා අවසර ලබාදීම. |
| | - | මූල්‍ය ක්ෂේත්‍රයේ පිළිගත් විශිෂ්ට ක්‍රියාමාර්ගයන්ට අනුකූල වන පරිදි ප්‍රාථමික අලෙවිකරුවන් හට නිකුත් කරන ලද සමාලෝචන උපදේශයන් යාවත්කාලීන කිරීම හා සමාලෝචනය කිරීම. |

## මූල්‍ය අංශය

| | | |
|---|---|---|
| 2010 ජනවාරි 01 | - | නව සපිරි ග්‍රාමීය ණය යෝජනා ක්‍රමය, කෘෂි සත්ත්ව පාලන ණය යෝජනා ක්‍රමය සහ *"කෘෂි නවෝදය"* විශේෂ ණය යෝජනා ක්‍රමය යන කෘෂිකාර්මික ණය යෝජනා ක්‍රම තුන සඳහා වන වාර්ෂික ණය පොලී අනුපාතිකය සියයට 12 සිට සියයට 8 දක්වා අඩු කරන ලදී. |
| | - | ලියාපදිංචි මූල්‍ය සමාගම්වල තැන්පතු පොලී අනුපාතික සහ බැඳුම්කර සහ අනෙකුත් උපකරණවල වට්ටම් අනුපාතිකයන්හි ඉහළ සීමාව සංශෝධනය කිරීම සඳහා විධාන නිකුත් කරන ලදී. |
| | - | ලියාපදිංචි මූල්‍ය සමාගම්වල ජ්‍යෙෂ්ඨ පුරවැසියන් විසින් පවත්වාගෙන යනු ලබන ස්ථාවර හෝ ඉතුරුම් තැන්පතු සඳහා දැනට පවතින පොලී අනුපාතිකයට අමතරව සියයට 1 ක ප්‍රසාද පොලියක් ගෙවීම සඳහා එම සමාගම්වලට අවසර ලබාදෙමින් විධානයක් නිකුත් කරන ලදී. |
| 2010 ජනවාරි 05 | - | බලපත්‍රලාභී බැංකුවල ජ්‍යෙෂ්ඨ පුරවැසියන් විසින් රුපියල් වලින් පවත්වාගෙන යනු ලබන තැන්පතු සඳහා සියයට 20 ක ප්‍රසාද පොලියක් 2010 ජනවාරි 01 දින සිට ක්‍රියාත්මක වන පරිදි ලබාදීමට රජය විසින් තීරණය කරන ලදී. |
| 2010 ජනවාරි 19 | - | විශේෂ හේතු මත ද්‍රවශීලතා ගැටලුවට මුහුණ දෙන ලියාපදිංචි මූල්‍ය සමාගම් සහ විශේෂිත කල්බදු මූල්‍යකරණ සමාගම් ලබාගන්නා බැංකු ණය මුදල් සඳහා මහ බැංකුව මගින් ලබාදෙන ණය සහතික කිරීමේ වැඩ පිළිවෙලට අදාල මෙහෙයුම් උපදෙස් එම ලියාපදිංචි මූල්‍ය සමාගම් සහ විශේෂිත කල්බදු මූල්‍යකරණ සමාගම් වෙත නිකුත් කරන ලදී. |
| 2010 ජනවාරි 22 | - | ශ්‍රී ලංකා මහ බැංකුව විසින් ක්‍රියාත්මක කරනු ලබන *"පිබිදෙන උතුර"* විශේෂ ණය යෝජනා ක්‍රමය සහ නැගෙනහිර පළාත සංවර්ධනය සඳහා වන යෝජනා ක්‍රමය සඳහා වන පොලී අනුපාතික වසරකට සියයට 12 සිට වසරකට සියයට 9 දක්වා අඩු කරන ලදී. |

2010 පෙබරවාරි 25 - වසර 2009 අග භාගයේ සිට නියම කරන ලද සියයට 10 ක අනිවාර්ය අවශ්‍යතාවයට වඩා අඩු ප්‍රතිශතයකින් කෘෂිකර්ම අංශයට ණය ලබා දී ඇති බැංකුවලට එම හිඟ ප්‍රමාණය ශ්‍රී ලංකා මහ බැංකුවේ ප්‍රාදේශීය සංවර්ධන දෙපාර්තමේන්තුව මගින් කෘෂි ක්ෂේත්‍රයට ණය ලබාදීම සඳහා පවත්වාගෙන යනු ලබන විශේෂ අරමුදලට බැර කරන ලෙස නියම කරන ලදී.

2010 මාර්තු 01 - ණය කාඩ්පත් නිකුත් කරන්නන්ගේ කටයුතු විධිමත් කිරීම සඳහා මෙහෙයුම් මාර්ගෝපදේශ නිකුත් කරන ලදී.

2010 මාර්තු 11 - 2008 ඔක්තෝබර් මස 31 දින යොමු අංකඃ 02/17/800/0006/01 යටතේ ආනයන බිල්පත් ගෙවීම් මත ක්‍රියාකිරීමේ උපදෙස් ඉවත් කරන ලදී.

2010 මාර්තු 22 - කෘෂිකර්මාන්තය, සත්ත්ව පාලනය, ක්ෂුද්‍ර, සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායන් සහ කවර හෝ ආපදාවකට ලක්වන ක්ෂුද්‍ර, සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායන්ට ණය පහසුකම් සැපයීමේ අරමුණින් *"සෞභාග්‍යා"* නමින් නව ණය යෝජනා ක්‍රමයක් දියත් කරන ලදී.

2010 මැයි 07 - උතුරු පළාතේ නව බැංකු ශාඛා හයක් විවෘත කිරීමට අනුමැතිය ලබාදෙන ලදී.

2010 මැයි 14 - මුදල් විශුද්ධිකරණය හා ත්‍රස්තවාදයට අරමුදල් සැපයීම සම්බන්ධ සැක කටයුතු පුද්ගලයින් පිළිබඳ විමර්ශන සිදු කිරීමට හා ඔවුන්ට එරෙහිව නඩු පැවරීමට පහසුකම් සැලසීම සඳහා තොරතුරු හුවමාරු කර ගැනීමේ අරමුණින් ශ්‍රී ලංකා මහ බැංකුවේ මූල්‍ය බුද්ධි ඒකකය, ශ්‍රී ලංකා රේගුව සමග අවබෝධතා ගිවිසුමක් අත්සන් තබන ලදී.

2010 මැයි 26 - අක්‍රීය ණය ආපසු ගෙවීම සඳහා ණයගැතියාගේ හෝ වෙනක් පාර්ශ්වයකගේ නමින් ණය පහසුකම ලබාදීමට 2011 ජුනි 30 දින දක්වා බැංකුවලට අවසර දෙමින් නියෝගයක් නිකුත් කළ අතර, මෙම නව පහසුකම අක්‍රීය ණය යටතේ වර්ගීකරණය කිරීම අවශ්‍ය නොවේ.

2010 ජූලි 01 - ශ්‍රී ලංකා මහ බැංකුව විසින් තම හතරවන ප්‍රාදේශීය කාර්යාලය යාපනයේ දී විවෘත කළ අතර, එහි ප්‍රාථමික කාර්යය වන්නේ ශ්‍රී ලංකා මහ බැංකුව මගින් හඳුන්වාදෙන ලද සංවර්ධනය අරමුණු කරගත් ණය යෝජනා ක්‍රම ක්‍රියාත්මක කිරීමයි.

2010 ජූලි 09 - ශ්‍රී ලංකා මහ බැංකු ප්‍රතිමිලදී ගැනීම් හා ප්‍රතිවිකුණුම් අනුපාතික පිළිවෙලින් වසරකට සියයට 7.25 ක් සහ සියයට 9.50 ක් දක්වා පදනම් අංක 25 කින් අඩු කරන ලදී.

2010 ජූලි 26 - සීමාසහිත ගෝල්ඩන් කී ක්‍රෙඩිට් කාඩ් සමාගමෙහි සියලුම සුදුසුකම් ලත් තැන්පත්කරුවන් හට විගණන පරීක්ෂාවෙන් අනතුරුව, 2008 දෙසැම්බර් 31 දිනට තිබූ තැන්පතු ශේෂයෙන් සියයට 75 ක් හෝ රුපියල් 100,000 යන දෙකෙන් අඩු වටිනාකමක් ගන්නා අගය ගෙවන ලදී.

2010 ජූලි 29 බලපත්‍රලාභී බැංකුවල අවම ප්‍රාග්ධන අවශ්‍යතාව පහත දැක්වෙන පරිදි වැඩි කරන ලදී:

නව බැංකු සඳහා අවම ප්‍රාග්ධන අවශ්‍යතාව (රුපියල් බිලියන)

| බැංකු වර්ගය | 2010 සිට | 2012 සිට | 2014 සිට |
|---|---|---|---|
| බලපත්‍රලාභී වාණිජ බැංකු | 3.0 | 4.0 | 5.0 |
| බලපත්‍රලාභී විශේෂිත බැංකු | 2.0 | 2.5 | 3.0 |

දැනට පවත්නා බැංකු සඳහා අවම ප්‍රාග්ධන අවශ්‍යතාව (රුපියල් බිලියන)

| බැංකු වර්ගය | 2011 අග වනවිට | 2013 අග වනවිට | 2015 අග වනවිට |
|---|---|---|---|
| බලපත්‍රලාභී වාණිජ බැංකු | 3.0 | 4.0 | 5.0 |
| බලපත්‍රලාභී විශේෂිත බැංකු | 2.0 | 2.5 | 3.0 |

| | | |
|---|---|---|
| 2010 අගෝස්තු 08 | - | ශ්‍රී ලංකා මහ බැංකු ප්‍රතිවිකුණුම් අනුපාතිකය වසරකට සියයට 9.00 දක්වා පදනම් අංක 50 කින් අඩු කරන ලදී. |
| 2010 අගෝස්තු 19 | - | සියළුම ලියාපදිංචි නොවූ බැංකු 2011 දෙසැම්බර් මස 31 දින වන විට කොළඹ කොටස් හුවමාරුව තුළ ලියාපදිංචි වීමට අනිවාර්ය කරන ලදී. |
| 2010 සැප්තැම්බර් 09 | - | 2010 ඔක්තෝබර් අග සිට අවම වශයෙන් පහත දැක්වෙන මට්ටම් දක්වා ණය පොලී අනුපාතික අඩු කරන ලෙස ශ්‍රී ලංකා මහ බැංකුව සියලුම බැංකුවලින් ඉල්ලා සිටින ලදී:<br>• නිවාස ණය සඳහා වන වාර්ෂික පොලී අනුපාතික සියයට 14 දක්වා<br>• ණය කාඩ්පත් අත්තිකාරම් සඳහා වන වාර්ෂික පොලී අනුපාතික සියයට 24 දක්වා<br>• අනෙකුත් ණය සහ අත්තිකාරම් සඳහා වන වාර්ෂික පොලී අනුපාතික සියයට 1-2 ත් අතර මට්ටමකින් අඩු කිරීම. |
| 2010 සැප්තැම්බර් 27 | - | ශේෂ පත්‍රයේ පවතින නොගෙවූ ක්‍රියාකාරී ණය ගිණුම් සහ විශේෂයෙන් ප්‍රකාශිත ශේෂ පත්‍රයේ සඳහන් වන ණය පහසුකම සඳහා අවදානම් පොලී ඉවත් කොට ලද ශුද්ධ අගයට සියයට 0.5 ක සාමාන්‍ය වෙන් කිරීමක් සිදු කිරීමට 2012 ජනවාරි මස 01 දින සිට බලපැවැත්වෙන පරිදි නියම කළ අතර, දැනට සියයට 1 ක පවතින සාමාන්‍ය වෙන් කිරීම සියයට 0.5 දක්වා අඩු කිරීමට කාර්තුවකට සියයට 0.1 බැගින් කාර්තු 5 ක් තුළ දී 2010 ඔක්තෝබර් මස 01 දින සිට සිදු කළ යුතු වේ. |
| 2010 ඔක්තෝබර් 01 | - | මුදල් නීති පනතේ විධිවිධානවලට අනුව ශ්‍රී ලංකා තැන්පතු රක්ෂණ ක්‍රමය ආරම්භ කරන ලදී. මේ සඳහා සියලුම බලපත්‍රලාභී බැංකු සහ ලියාපදිංචි මූල්‍ය සමාගම්වල සහභාගිත්වය අනිවාර්ය වේ. |
| 2010 ඔක්තෝබර් 06 | - | ලියාපදිංචි මූල්‍ය ආයතනයක් ලියාපදිංචි වන පළමු වසරේ දී ගෙවිය යුතු රුපියල් 50,000 ක බලපත්‍ර ගාස්තුව රුපියල් 500,000 දක්වා වැඩි කරන ලදී. |
| | - | ලියාපදිංචි මූල්‍ය ආයතන සඳහා වන වාර්ෂික බලපත්‍ර ගාස්තුව, ලියාපදිංචි මූල්‍ය ආයතනය මගින් පෙර මූල්‍ය වසර සඳහා ගණනය කරන ලද මුළු වත්කම් ප්‍රමාණය මත පදනම්ව දැනට පවතින රුපියල් 50,000 ක අගය රුපියල් 150,000 සිට රුපියල් 500,000 ක පරාසයක් දක්වා වැඩි කරන ලදී. |
| | - | විවට වෙළෙඳපොළ ක්‍රියාකාරකම් මත සිදුවන වෙන්දේසි අත් හිටුවන ලදී. |
| 2010 ඔක්තෝබර් 28 | - | මුදල් විශුද්ධිකරණය හා ත්‍රස්තවාදයට අරමුදල් සැපයීම සම්බන්ධ සැක කටයුතු පුද්ගලයින් පිළිබඳ විමර්ශන කටයුතු සිදුකිරීමට හා ඔවුන්ට එරෙහිව නඩු පැවරීමට පහසුකම් සැලසීම සඳහා තොරතුරු හුවමාරු කරගැනීමේ අරමුණෙන්, ශ්‍රී ලංකා මහ බැංකුවේ මූල්‍ය බුද්ධි ඒකකය, බංගලිදේශ මහ බැංකුවේ මුදල් විශුද්ධිකරණය වැළැක්වීම පිළිබඳ වූ දෙපාර්තමේන්තුව සමග අවබෝධතා ගිවිසුමක් අත්සන් කරන ලදී. |
| 2010 නොවැම්බර් 02 | - | ව්‍යාපාර ක්‍රියාකාරකම් බාහිර මූලාශ්‍ර වෙත පැවරීමේ දී පැනනැගිය හැකි අවදානම නියාමනය කිරීම සහ පාලනය කිරීම සඳහා සියලු වාණිජ බැංකු වෙත උපදේශන නිකුත් කරන ලදී. |
| 2010 නොවැම්බර් 08 | - | වාණිජ බැංකු මගින් 2011 වසර සඳහා ගෙවනු ලබන වාර්ෂික බලපත්‍ර ගාස්තුව එම බැංකුව මගින් පෙර වසර සඳහා ගණනය කරන ලද මුළු වත්කම් ප්‍රමාණය මත පදනම්ව රුපියල් මිලියන 2 සිට රුපියල් මිලියන 10 ක පරාසයක් දක්වා වැඩි කරන ලදී. |
| 2010 නොවැම්බර් 23 | - | උතුරු පළාතේ ගැටුම් පැවති ප්‍රදේශ වල ඉඩම් සුරැකුම් ලෙස තබා ගන්නා වගා ණය සඳහා ඇප ආවරණ යෝජනා ක්‍රමයක් හඳුන්වා දෙන ලදී. |
| 2010 නොවැම්බර් 24 | - | සියළු බලපත්‍රලාභී බැංකුවල සේවය කරනු ලබන විධායක ශ්‍රේණියේ නිලධාරීන්ගේ ශක්‍යතාවය හා යෝග්‍යතාවය ඇගයීමේ ක්‍රියාවලිය පුළුල් කරන ලදී. |
| 2010 දෙසැම්බර් 09 | - | විශේෂිත කල්බදු මූල්‍යකරණ සමාගම්වල ස්ථායීතාවය හා කම්පනවලට ඔරොත්තු දීමේ හැකියාව වැඩි කිරීමේ අරමුණින් ඔවුන්ගේ අවම හර ප්‍රාග්ධනය 2012 ජනවාරි 01 දින සිට රුපියල් මිලියන 100 දක්වා ද තවදුරටත් පිළිවෙළින් 2013, 2014, 2015 සහ 2016 යන වර්ෂ ආරම්භයේ දී රුපියල් මිලියන 150, රුපියල් මිලියන 200, රුපියල් මිලියන 250 සහ රුපියල් මිලියන 300 දක්වා ද වැඩි කිරීමට නියෝග කරන ලදී. |

- විශේෂිත කල්බදු මූල්‍යකරණ සමාගම් විසින් ශ්‍රී ලංකා මහ බැංකුව වෙත සැපයිය යුතු වාර්තා ඉදිරිපත් කිරීම සඳහා අන්තර්ජාලය පදනම් කරගත් දත්ත සම්ප්‍රේෂණ පද්ධතියක් හඳුන්වා දෙන ලදී.

- විශේෂිත කල්බදු මූල්‍යකරණ සමාගම්වල ඕනෑම ශාඛාවක්/ව්‍යාපාරික ස්ථානයක් ආරම්භ කිරීම, වෙනත් ස්ථානයක ස්ථානගත කිරීම, සහ වසා දැමීම සඳහා බැංකු නොවන මූල්‍ය ආයතන දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂකතුමාගෙන් අවසරය ලබාගත යුතු අතර ඒ සඳහා විධානයක් එම සමාගම් වලට නිකුත් කරන ලදී.

2010 දෙසැම්බර් 27

- පොදු සමාගමක් මූල්‍ය කල්බදු පනත යටතේ ලියාපදිංචි වීමේදී පැවතිය යුතු අවම නිකුත් කළ හා ගෙවා නිමි ප්‍රාග්ධනය 2011 ජනවාරි 01 දින සිට රුපියල් මිලියන 100 දක්වා වැඩි කළ අතර, 2015 ජනවාරි 01 දින වන විට රුපියල් මිලියන 300 ක් වන පරිදි වාර්ෂිකව රුපියල් මිලියන 50 බැගින් ක්‍රම ක්‍රමයෙන් වැඩි කළ යුතු බවට නියෝග නිකුත් කරන ලදී.

- ලියාපදිංචි කල්බදු මූල්‍යකරණ ආයතනයක් ලෙස අයදුම් කිරීමේ දී, ප්‍රථම වරට ලියාපදිංචි වීමේ දී සහ වාර්ෂිකව ලියාපදිංචිය අළුත්කර ගැනීමේ දී ගෙවිය යුතු ගාස්තුව වැඩි කරන ලදී. මේ අතරින් වාර්ෂිකව ලියාපදිංචිය අළුත් කරවා ගැනීමේ දී ගෙවිය යුතු ගාස්තුව ලියාපදිංචි කල්බදු මූල්‍යකරණ ආයතනය මගින් පෙර වසර සඳහා ගණනය කරන ලද මුළු වත්කම් ප්‍රමාණය මත පදනම්ව රුපියල් 150,000 සිට රුපියල් 500,000 දක්වා පරාසයක වේ.

2011 ජනවාරි 11

- මිල විචලතා සහ වත්කම් මිලෙහි සිදුවන ව්‍යාජ වැඩිවීම් මගින් ඇතිවිය හැකි අවදානම් තත්ත්වයන් පාලනය කිරීම සඳහා සුදුසු අවදානම් කළමනාකරණ ප්‍රමිතීන්ට අනුගත වන ලෙස සහ කොටස් සම්බන්ධ ආන්තික වෙළෙඳ ව්‍යාපාරයන් සඳහා බැංකුවල ප්‍රවේශයන්ට සීමාවන් හඳුන්වා දෙන ලෙස සියළුම බලපත්‍රලාභී බැංකු වලට නියම කරන ලදී.

- ශ්‍රී ලංකා මහ බැංකුවේ ප්‍රතිමිලදී ගැනීම් අනුපාතිකය සියයට 7.00 දක්වා පදනම් අංක 25 කින් අඩු කළ අතර, ප්‍රතිවිකුණුම් අනුපාතිකය සියයට 8.50 දක්වා පදනම් අංක 50 කින් අඩු කරන ලදී.

2011 පෙබරවාරි 04

- ශ්‍රී ලංකා මහ බැංකුව විසින් "සංවර්ධනය, සෞභාග්‍යය හා ශ්‍රී ලංකාවේ නැටුම් ශිල්පීන්" යන තේමාව යටතේ 11 වන ව්‍යවහාර මුදල් නෝට්ටු කාණ්ඩය ලෙස නව මුදල් නෝට්ටු කාණ්ඩයක් හඳුන්වා දෙන ලදී. එම කාණ්ඩය රුපියල් 5,000, රුපියල් 1,000, රුපියල් 500, රුපියල් 100, රුපියල් 50 හා රුපියල් 20 යන මුදල් නෝට්ටුවලින් සමන්විතය.

2011 මාර්තු 09

- ජංගම ගෙවීම් පද්ධතිය නියාමනය සහ අධීක්ෂණය කිරීමේ අරමුණින් ජංගම ගෙවීම් මාර්ගෝපදේශ මාලාවක් නිකුත් කරන ලදී.

**අපේක්ෂිත**

- බැංකුවල අවදානම් කළමනාකරණය සහ ප්‍රාග්ධන සැලසුම් ක්‍රියාවලිය තවදුරටත් ශක්තිමත් කිරීම සඳහා බාසල් II හි දෙවන අදියර ක්‍රියාත්මක කිරීමට අදාල මාර්ගෝපදේශ නිකුත් කිරීම.
- ගනුදෙනුකරුවන්ගේ ප්‍රඥප්ති සහ නියාමන බැංකු සඳහා නිකුත් කිරීම.
- අනාවරණයන් ප්‍රවර්ධනය උදෙසා ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති 44 සහ 45 කෙරෙහි අනුගතවීම සඳහා පහසුකම් සැලසීම.
- බැංකු පනතට අදාළ යෝජිත සංශෝධන සම්පූර්ණ කිරීම.
- ඒකාබද්ධ අධීක්ෂණය සඳහා රාමුවක් සකස් කිරීම.
- බැංකු අභ්‍යන්තරිකව ශ්‍රේණිගත කිරීමේ ක්‍රමය තවදුරටත් ක්‍රමවත් කිරීම.
- බාසල් III ඉදිරිපත් කළ යෝජනා ක්‍රියාවට නැංවීම.
- අන්තර්ජාල ගෙවීම නියාමනය කිරීම සඳහා අන්තර්ජාල ගෙවීම් මාර්ගෝපදේශ නිකුත් කිරීම.
- නව මූල්‍ය වෙළෙඳ පනතක් හඳුන්වා දීම.
- කල්බදු මූල්‍ය පනතේ අවශ්‍ය සංශෝධනයන් සිදු කිරීම.
- ඉස්ලාමීය බැංකු ආවරණය වන පරිදි විචක්ෂණ නියෝග නිකුත් කිරීම.